සැ. යු.- 2012.09.21 දින පළවූ අංක 1777 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2009 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,778 - 2012 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2012.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1400 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1400 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ඔක්තෝබර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

බී. කේ. එස්. රවීන්ද්‍ර,
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1397 - B 80650 —9,935 (2012/09)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන උප දුම්රිය ස්ථානාධිපති තනතුරු සඳහා බඳවා ගැනීමට 2012.08.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි පුරප්පාඩු පවතින උප දුම්රිය ස්ථානයක් ලෙස වනවාසල උප දුම්රිය ස්ථානය ද, ඇතුළත් කරන බව මෙයින් දැනුම් දෙමි. ඒ අනුව ඉහත තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2012.10.12 වැනි දින දක්වා දීර්ඝ කරන බව දැනුම් දෙමි.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ය.

09-1154

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 වර්ෂය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 ජනවාරි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1225/32 දරන 2002.03.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

*විභාග පරිපාටිය* :

(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පහත දැක්වෙන විෂයන් ඇතුළත් වේ. :

| | | |
|---|---|---|
| විෂය අංකය | 01 | සාමාන්‍ය පරිපාලනය.— ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහයේ විධිවිධාන, රජයේ වෙනත් රෙගුලාසි |
| විෂය අංකය | 02 | මුදල් |
| විෂය අංකය | 03 | අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය |

(ආ) නිලධාරියකුට I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයකදී හෝ පෙනී සිටිය හැකිය.

(ඇ) සෑම ප්‍රශ්න පත්‍රයකට ම කාලය පැය 03 යි.

03. *විෂය නිර්දේශය* :

(01) සාමාන්‍ය පරිපාලනය :

(අ) ලංකා (ආණ්ඩුක්‍රම) රාජ ආඥාව 1946 හා 1947 (973 වන පරිච්ඡේදය)
1948 අංක 18 පුරවැසිපනත (349 වන පරිච්ඡේදය)
1972 මැයි 22 දින පනවා සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත
1981 අංක 19 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
1981 අංක 07 දරන ජනමත විචාරණ පනත
1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ආ) කාර්යාලයීය සහ ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම :
ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රජයේ වෙනත් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V, VI, VII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

(02) මුදල් :

(අ) රජයේ මුදල් රෙගුලාසි 1 වන කොටස (1 වැනි පරිච්ඡේදය හැර)

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තු උදා :- ඒවායේ සැකසීම. ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජන පනත්

(ඇ) අධ්‍යාපන කාර්යාල මගින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළවන ආඥාපනත් සහ වෙනත් නීති ප්‍රඥප්ති.

03. *අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය* :—

(අ) *අධ්‍යාපන නීතිය.*— අපේක්ෂකයන් පහත සඳහන් ආඥා පනත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතු ය.

* 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත
* 1947 අංක 26 දරන සංශෝධන ආඥාපනත
* 1951 අංක 05 දරන සංශෝධන පනත
* 1953 අංක 43 දරන සංශෝධන පනත
* රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය
* 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධි විධාන සංශෝධන) පනත
* 1961 අංක 08 දරන උපකෘත පාසල් හා ගුරු විද්‍යාල (අතිරේක විධි විධාන) පනත
* 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත
* 1979 අංක 64 දරන පිරිවෙන් පනත
* 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන - සංශෝධන පනත)
* 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත

(ආ) අධ්‍යාපන පරිපාලනය.—

(1) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති

(i) අධ්‍යාපන අමාත්‍යාංශය

(ii) දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්

(iii) ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් අධ්‍යාපනික සැලසුම් කිරීම, පරමාර්ථ, ක්‍රම (පාසල් සැලසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය.

(2) පාසල් කළමනාකරණය, පාසල් ප්‍රජා සම්බන්ධතා

(3) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධති

(4) විශේෂ අධ්‍යාපන වැඩසටහන්

(ඇ) අධ්‍යාපන අධීක්ෂණය.—

* පාසල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන
* පාසල්වල අඛණ්ඩ ඇගයීම් වැඩසටහන්
* පාසල්වල ස්වයං ඇගයීම් වැඩසටහන්
* දිස්ත්‍රික්, දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් පාසල් අධීක්ෂණය කිරීම
* බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය

(අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳව මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)

*නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන* :

* අධ්‍යාපන සැලසුම් හා පරිපාලනය පිළිබඳ ආසියාතික ආයතන (1970)
* අධ්‍යාපන පරිපාලනය පිළිබඳ නව කළමනාකරණ ශිල්පීය ක්‍රම
* සම්මන්ත්‍රණයක වාර්තාවක් - නවදිල්ලිය
* බැරි සහ ටයි (1975) පාසලක් පවත්වාගෙන යාම ටෙම්පල් ස්මිත් ලන්ඩන්
* බුෂ් ටී ග්ලැටර් ආර් ගුඩ් සහ සී රිවස් (1980) පාසල්
* කළමනාකරණ විධි හාර්පර් සහ රෝ
* ආචාර්යය කාන් මොහිදීන් ෂෙරිෆ් 1983
* පාසල් පරිපාලනය - නවදිල්ලිය
* අධ්‍යාපන අමාත්‍යාංශය ලංකාවේ අධ්‍යාපනය (1969)
* අධ්‍යාපන හා සංස්කෘතික වැඩ කටයුතු අමාත්‍යාංශයේ ශත සංවත්සරික කාණ්ඩය II වන හා III වන කොටස්
* විවෘත විශ්ව විද්‍යාලය (1981) පාසල්වල ප්‍රතිපත්ති සම්පාදනය සංවිධානය හා නායකත්වය (ඊ 323 පාඨමාලාවේ 4 වන කොටස) විවෘත විශ්ව විද්‍යාලය යුනිවර්සිටි ප්‍රෙස් ලන්ඩන් ෂිප්මන් මර්ටන් (1983) පාසලෙහිම ඇගයීම හයිස්මන් අධ්‍යාපන පොත් ලන්ඩන් අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තාව - 1984

04. සාමාර්ථ්‍යයන් සඳහා එක් එක් විෂයයකට, මුළු ලකුණුවලින් 40%ක් බැගින් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු ය.

05. *විභාගයේ භාෂා මාධ්‍යය* :

(i) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එක් මාධ්‍යයකින් පිළිතුරු ලිවිය හැක.

(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරඟ විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරඟ විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

06. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීම ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතියට අනුව ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පතෙහි අංක 01 සිට 06 තෙක් ඡේදයන් පළමු වන පිටුවෙහිත් ඉතිරිය දෙවන පිටුවෙහිත් සඳහන් කරන්න.) සිංහල අයැදුම්පත්‍රයේ විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයැදුම්පත්‍රයේ විභාගයේ නම දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව ද සලකන්න.

08. විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළ කොට ඇත.

09. ඉල්ලුම්පත්‍ර 2012.10.31 වැනි දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි

කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම ද සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2/3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී ඔබ ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමග ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායි වනු ඇත. (ෆැක්ස් අංකය 011-2784232) ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් කරන්න.

(i) විභාගයේ නම :—————.
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————.
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :—————.
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය ලියාපදිංචි අංකය හා තැපැල් කාර්යාලය :—————.

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

12. විභාග ශලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදෙස් ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(අ) පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.)

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා
සම්පූර්ණ විභාගය සඳහා රු. 1,000 0 යි
එක් විෂයයකට රු. 500 0 යි

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

බත්තරමුල්ල,
පැලවත්ත,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 වර්ෂය
First Efficiency Bar Examination for Officers in Class III of the Sri Lanka Education Administrative Service - 2012

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ∶
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)

01. (අ) මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ∶- උදා ∶ SILVA S. A. :—————.

(ආ) මුල්'කුරුවලින් හැඳීන්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

02. ලිපිනය
(i) රාජකාරි ලිපිනය :—————.
(ii) පෞද්ගලික ලිපිනය :—————.
(iii) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(iv) දුරකථන අංකය :—————.

03. නිවේදනයේ 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

විෂය අංකය :— විෂයය :—
විෂය අංකය :— විෂයය :—
විෂය අංකය :— විෂයය :—

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. උපන් දිනය වර්ෂය මාසය දිනය

06. (i) පදවි නාමය :—————.
(ii) දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය/පාසල :—————.

07. මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය විෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *වර්ෂය* | *විෂයය* | *මාධ්‍යය* |
|---|---|---|
| ……………… | ……………… | ……………… |
| ……………… | ……………… | ……………… |
| ……………… | ……………… | ……………… |

08. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 06 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලුම නීති රීතිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළඟ තබා ගන්න. අදාළ නම් පමණි.) |

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, 06 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බව ද ප්‍රකාශ කරමි. (*)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව.

දිනය :————.

(*) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.

09-723

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීමට මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය ඃ*

2013 ජනවාරි මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වේ. එම නගර සහ නගර වලට අදාල නගර අංක පහත පරිදි වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි හෝ මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| යාපනය | 10 |
| අම්පාර | 16 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුරය | 24 |

මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

03. *සේවා කොන්දේසි ඃ*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද යටත්ව, රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවාගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය සේවයේ පොදු කොන්දේසි වලට ද, මෙතෙක් නිකුත් කර ඇති කළින් කල නිකුත් කරනු ලබන නියෝග, රෙගුලාසි වලට ද යටත් විය යුතුය. එමෙන්ම ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ පරිච්ඡේදයන් වලට ද යටත් විය යුතුය.

(iii) සේවයට පත් කරන නිලධාරියකු පත්වීම් බලධාරියා තීරණය කරන පරිදි පුහුණුවකට යටත් විය යුතුය.

(iv) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරීන් අවුරුදු තුන (03)ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(v) රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් වර්ෂයක් ගතවන තුරු වැඩ බැලීමේ පදනම මත පත්කරනු ලැබේ.

(vi) තනතුරකට පත්වී වසර තුනක් ගතවීමට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත විභාගය සමත් විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් නොකරනු ලැබේ.

(vii) තනතුර ස්ථිර කිරීමෙන් පසු රාජ්‍ය සේවයෙන් බඳවා ගත් නිලධාරීන්ට පෙර සේවයේ සාමාජිකත්වය අහිමිවන අතර, එම සේවයට ආපසු යාමේ අයිතිය ද නැතිවනු ඇත.

04. *වැටුප් පරිමාණය* :

එම්එන්-5-2006(A)
16,720-10x320-11x365-15x450-රු. 30,685
6/2006 (iv) චක්‍රලේඛය

05. *වයස් සීමාව* :

වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

06. සුදුසුකම් : 2012 සැප්තැම්බර් මස 28 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරිමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු වීම

*හෝ*

(iii) නීති විද්‍යාලයේ අවසාන නීති විභාගයෙන් සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නිතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී ඇති නිතීඥවරයෙකු වීම.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* : අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතුය. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා, ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, ඉහළම ලකුණු ලැබූ අය අනුපිළිවෙලින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සහතික පත් පරීක්ෂා කිරීමට පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි.

08. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු. 750 කි.

මෙම විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පළමුව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ තැන්පත් කර අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයෙහි නියමිත ස්ථානයෙහි ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට ඈදා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත් වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත් වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යොදන්න. එය කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින්, 8 1/2" x 12" ප්‍රමාණයේ කඩදාසියක සකස් කල යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශිර්ෂ අංක 1 සිට 7 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කරන්න. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍ර විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න අයදුම්කරු විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් දන්වමි. අයදුම්පත්‍රයෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම, අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් ම විය යුතුය.

(ඇ) ඉල්ලුම් පත් 2012.10.30 වැනි දින හෝ එදිනට පෙර, ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයෙහි වමත්පස ඉහළ කෙළවරේ "රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරු වලට බඳවා ගැනීමේ තරග විභාගය - 2012" යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*සටහන* : රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඉ) ඉල්ලුම්පතක් ලද බව දන්වනු නොලැබේ. අදාල විභාග ගාස්තුව ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපැල් මගින් එවනු ඇත. ඒ හා සමගම ඒ බැව් දන්වා පුවත්පත් නිවේදනයක් පත්‍රයේ පළවනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශපත් නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රය හා මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපත ද, ලියාපදිංචි කල කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායි වනු ඇත.

10. *විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීම* :

(i) විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) සෑම විභාග අපේක්ෂකයෙකු ම තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු පොදු නීති රීති වලට යත්විය යුතුය.

(iii) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත.

(ii) නිකුත් කරන ලද දිනය, විභාගය පවත්වන දිනයට අවුරුදු 03කට කලින් නොවන පරිදි වන වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

12. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

(අ) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම රෙගුලාසිවලින් සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

14. *විභාග පරිපාටිය* :

(i) මාධ්‍යය :

(අ) සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් එක් මාධ්‍යකින් ඉල්ලුම් කළ හැක.

(ආ) සියලුම අයදුම්කරුවන්, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් ම සියලුම ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.

(ඇ) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස්කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.

(ii) විෂයන් සහ විෂය නිර්දේශය :

විභාගය, පහත සඳහන් විෂයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්නපත්‍ර වලින් සමන්විත වේ.

| *විෂය* | *විෂය අංකය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| අභියෝග්‍යතාවය | 01 | පැය 1.00 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | 02 | පැය 1.00 | 100 | 40 |
| භාෂාව හා රචනය | 03 | පැය 1.00 | 100 | 40 |

**විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාව<br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ. | අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය හා වාචික නොවූ ප්‍රස්තුත ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරෙන තොරතුරු පිළිබඳව වලංගු නියමයන්ට එළඹීමට ඇති හැකියාව හා දැනුම මැනීම පිණිස සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයක්. |
| සාමාන්‍ය දැනීම<br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | ශ්‍රී ලංකාවේ සමාජමය හා සංස්කෘතික රටාව හා ජාතික මෙන්ම අන්තර්ජාතිකව ද වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනයද සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයක්. |
| භාෂාව හා රචනය<br>ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | දෙන ලද මාතෘකා/තේමා ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනීම පිරික්සීම. |

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2012 සැප්තැම්බර් මස 28 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය - 2012

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය (සිංහල 2/දෙමළ 3) [ ]

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි [ ]

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

* *ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා දිස්ත්‍රික්ක අංකය සඳහන් කරන්න.*

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(1) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. SILVA A. B. :————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(2) සම්පූර්ණ ලිපිනය :
i. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ii. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
iii. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(3) ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1 (කොටුවේ අදාල අංකය යොදන්න)
පුරුෂ - 0

(4) විවාහක/අවිවාහක බව : විවාහක - 1 (කොටුවේ අදාල අංකය යොදන්න)
අවිවාහක -2

(5) ජාතික හැඳුනුම්පත් අංකය

(6) i. උපන් දිනය : වර්ෂය මාසය දිනය

ii. ………… දිනට වයස අවු. මාස දින

(7) විභාගය සඳහා අයදුම් කිරීමට ඔබ සුදුසුකම් ලබා ඇත්තේ විභාග නිවේදනයේ කුමන ඡේදය යටතේ ද ?
(6 (ii) හෝ 6(iii)) :————.

7.1 6(ii) ඡේදය යටතේ නම්
උපාධිය :————.
සුදුසුකම් සපුරා ඇති දිනය :————.
6(iii) ඡේදය යටතේ නම් :————.
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

(8)

| ගැලවීමට නොහැකි වන පරිදි මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න. |
|---|

ගාස්තු ගෙවූ ලදුපත විස්තර

i. විභාග ගාස්තුව ගෙවූ කාර්යාලය :————.
ii. ලදුපත් අංකය හා දිනය :————.
iii. ගෙවූ මුදල :————.

(9) අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. විභාග ගාස්තු ගෙවන ලද අංක …… හා ………… වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බව ප්‍රකාශ කරමි. විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත්, පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත්, මා වන්දියක් නොමැතිව ධුරයෙන් පහකළ හැකි බවටත් මම එකඟවෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-845

**කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, කාර්මික නිලධාරී III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012**

ඉහත තනතුරුවලට බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

03. වයස් සීමාව :-
ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

04. (a) III ශ්‍රේණිය
අධ්‍යාපන සුදුසුකම් :

(i) භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ.) විභාගයට දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම,

සහ

(ii) ශුද්ධ ගණිතය/ව්‍යාවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව අ.පො.ස. (උ.පෙළ) විෂයන් 03 කින් එකවර සමත්වීම.

වෘත්තීය සුදුසුකම් :

(*a*) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් හෝ පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ
(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ
(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ
(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ
(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම; හෝ
(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

අධ්‍යාපන සුදුසුකම් :

ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයන් තුනකින් අ.පො.ස. (උ.පෙ.) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

වෘත්තීය සුදුසුකම් :

ඉහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක රැකියා ක්ෂේත්‍රයට අදාල ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) ලබා තිබීම.

* විවෘත තරග විභාගයෙන් තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියකට සුදුසුකම් ලබන අයදුම්කරුවන්, සේවයට අදාල විෂය නිර්දේශය අනුව ලබා ගන්නා වසරක න්‍යාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත්වූ බවට අදාල ආයතන විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

* පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත්, ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අත්හිටුවනු ලැබේ.

05. වැටුප් පරිමාණය

(a) III ශ්‍රේණිය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN 3-2006A
15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 - 27,885

4 වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම් ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

06. සේවා කොන්දේසි :

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(2) තෝරාගනු ලබන අයදුම්කරුවන් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා අනුයුක්ත කරනු ඇත.

(3) තෝරාගන්නා අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත්වනු ඇත.

(4) තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, දැනටමත් රජයේ සේවකයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

(5) තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

07. (I) බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම විභාගය තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය මත විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012 දෙසැම්බර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

(II) විභාග ක්‍රමය :

(i) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(III) විභාගයේ විෂයන් : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(1) බුද්ධි පරීක්ෂණය
(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

08. විෂය නිර්දේශය :

(I) බුද්ධි පරීකෂණය :
කාලය පැය 01 කි
මුළු ලකුණු 100 යි
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියක්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(II) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 03 කි
මුළු ලකුණු 100 යි

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍යය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

* ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයකට 40% හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

* ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතුය.

09. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරනලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂ යටතේ අයදුම්කරුගේ නමින් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ

නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) අයදුම්පත්‍ර : ඒ4 (සෙ.මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සහ 03 තෙක් ඡේදයෙන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(iv) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2012 ඔක්තෝබර් මස 22 වැනි දින හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III වන ශ්‍රේණියට කෘෂිකර්ම අමාත්‍යාංශයට බඳවා ගැනීම - 2012" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත.

12. අපේක්ෂයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බල පත්‍රය.

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්. සකලසූරිය,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, කාර්මික නිලධාරී III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයː
සිංහල - 2 [ ]
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 තැපැල් නගරය :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ - 0 [ ]
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :- වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 2012.09.24 දිනට වයස :
අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

3.4 දුරකථන අංකය : | | | | | | | | | |

4.0 අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :—

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :—

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 තාක්ෂණ සුදුසුකම් :-

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතික පත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :————.

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :————.

7.2 දැනට දරන තනතුර :————.

7.3 සේවා කාලය :————.

7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව :————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියෙන් වරදකරු කරනු ලැබ තිබේද ? :————.

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තරය සඳහන් කරන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 අයදුම්කරුගේ සහතික :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

09-1261

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් සෘජු බඳවා ගැනීම් - 2012

අංක 1670/33 සහ 2010.09.10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.4 ඡේදයේ පරිදි ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත් 2012.10.25 දින හෝ එදිනට පෙර, කොළඹ 01, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් (ඒ) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.*- III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු 32 ට නොවැඩි සංඛ්‍යාවකට පත් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරීන් තෝරා ගනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය හැක.

03. *සේවා කොන්දේසි.*- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1670/33 සහ 2010.09.10 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා කොන්දේසිවලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කරනු ලබන සංශෝධන වලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි ශ්‍රේණියට පත් කරනු ලබයි. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අනුව භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

04. පත්වීම් දිනයේ සිට වසර 03 ක් ඇතුළත 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය-

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි එස්. එල්. 1-2006 වැටුප් බණ්ඩය අනුව මාසික වැටුප් පරිමාණය - රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555

(රු.24,870 හා රු.26.805 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් දෙකකි)

05. වෘත්තීය සුදුසුකම් :

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

හෝ;

(ii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අවසාන පරීක්ෂණය;

හෝ

(iii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනයක අවසාන පරීක්ෂණය;

හෝ

(iv) සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය;

හෝ

(v) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසාන පරීක්ෂණය සමත්ව තිබිය යුතු ය.

06. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

07. වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 7.4.3.3 පරිදි සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv) සුදුසුකම් ලබන දිනය :

සේවයට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

08. *වයස් සීමාව* : අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට්පත්‍රයේ* පළ කරන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

09. පහත සඳහන් ලියවිලි අපේක්ෂකයෙකු විසින් සිය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකයේ පිටපතක් ;

(*ආ*) ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල පිටපත් ;

(*ඇ*) චරිත සහතික 2 ක් (මෙයින් එකක් විදුහල්පතිගෙන්/විශ්ව විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය.)

10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට අදාල ලකුණු පරිපාටිය පහත සඳහන් පරිදි වේ. :-

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| වෘත්තීය සුදුසුකම් | 50 | 40 |
| අධ්‍යාපන සුදුසුකම් | 20 | |
| පළපුරුද්ද | 15 | |
| පරිගණක සාක්ෂරතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | 05 | |
| | 100 | 40 |

11. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරියෙකු විසින් තමාගේ අයදුම්පතෙහි මුල් පිටපත ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (ඒ), මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය,

කොළඹ 01 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය. එහි පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම කෙලින්ම මෙම ලිපිනයට එවීමට පුළුවන.

12. ඉල්ලුම් කිරීමේ ක්‍රමය ඃ

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතු අතර එය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අපේක්ෂකයා විසින්ම සකස් කළ යුතු ය.

(ආ) ඉල්ලුම්පතේ අංක 01 සිට 05 දක්වා කරුණු මුල් පිටුවේ සඳහන් කළ යුතු ය. ඉල්ලම්පත්‍රය අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතු ය. කෙසේ වෙතත් ඉල්ලුම්පත්‍රය සකස් කරන විට එහි ශීර්ෂය ඉංග්‍රීසි භාෂාවෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැලේදී ඉල්ලුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ පිළිබඳව කෙරෙන අභියාචනා කිසිවක් සලකා බලනු නොලැබේ.

(ඈ) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් ම යටපත් කර ඇත්නම්, පත්වීමක් ලැබීමට ඔහු/ඇය නුසුදුස්සකු වීමට ඉඩ ඇත. රජයේ සේවයට පත් කළ පසුව මෙබන්දක් හෙළිවුවහොත් සේවයෙන් පහ කළ හැකිය.

13. පවතින පුරප්පාඩු සියල්ල හෝ කොටසක් හෝ පිරවීම පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

14. තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු තුන් අවුරුදු පරිවාස කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීමට පෙර පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතු ය.

(i) රජයේ මුල්‍ය පරිපාටි
(ii) නීතිය හා කළමනාකරණය
(iii) පරිපාලනය
(iv) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

15. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට පත්වීම් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි. නිලධාරියා තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සහ නියමිත සිංහල/දෙමළ ප්‍රවීණතා පරීක්ෂණය සමත්වී ඇති විට මෙම කාල සීමාව ඉක්මවීමෙන් අනතුරුව සේවය ස්ථිර කරනු ලැබේ.

16. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළකරන ලද දැන්වීම බලාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. ඒ. අබේසේකර,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

2012 සැප්තැම්බර් මස 28 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුර

**වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් සෘජු බඳවා ගැනීම- 2012**

අංකය [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය ඃ [ ]
සිංහල - 1 දෙමළ - 2 ඉංග්‍රීසි - 3
(අදාල අංකය කොටුව තුළ ලියන්න) මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

01 1.1 මුලකුරු සමග නම ඃMr/Mrs/Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා ඃMr. SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

02 2.1 ස්ථිර ලිපිනය :————.

2.2 රාජකාරී ලිපිනය :————.
(රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු විසින් ඔහුගේ රාජකාරී ලිපිනය ලිවිය යුතු ය. ලිපිනයෙහි වෙනසක් වුණිනම්, එය වහාම දැන්විය යුතු ය.)

03. 3.1 උපන් දිනය :————.

3.2 2012.09.28 දිනට වයස ඃ
අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ [ ස්ත්‍රී | පුරුෂ ]

05. විවාහක/අවිවාහක භාවය ඃ [ විවාහක | අවිවාහක ]

06. භාෂා ප්‍රවීණතාවය පිළිබඳ සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය ඃ

| *(i) සිංහල* | *(ii) දෙමළ* | *(iii) ඉංග්‍රීසි* |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |

07. *අධ්‍යාපන, වෘත්තීය හා කාර්මික සුදුසුකම්.-* (ලබා ගන්නා ලද ඉහළම උපාධි, විශිෂ්ට සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම්, පෙනී සිටි විෂයයන් සහ අදාළ ආයතනවල නම් සඳහන් කරන්න.) :————.

08. දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් ඉසිලූ තනතුරු.-රක්ෂාවට බැඳුණු දිනය, ඉන් අස්වූ දිනය, අන්තිමට ලැබූ වාර්ෂික වැටුප හා සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න.

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප (රුපියල්) | සේවය අවසන් කිරීමට හේතු |
|---|---|---|---|---|
| (1) | | | | |
| (2) | | | | |
| (3) | | | | |
| (4) | | | | |
| (5) | | | | |

09. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලබා තිබේද? එසේ නම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :————.

10. තවත් තොරතුරු කිසිවක් වේ නම්, ඒවා :————.

11. චරිත සහතික ලබාගන්නා අය හැර ඔබ ගැන තොරතුරු විමසිය හැකි ඔබ ගැන හොඳින් දන්නා පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න ඃ

(1) ————.

(2) ————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව දැනගතහොත් මා නුසුදුස්සකු වීමටත්, මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

අයදුම්කරු රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඔහු/ඇය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කරන .................................. මහතා/මහත්මිය/මෙනවිය ......... වැනි දින සිට ......... කාර්යාලයේ රාජ්‍ය සේවකයෙක්/පළාත් රාජ්‍ය සේවකයෙක් ලෙස සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :————.

09-1231

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත/සීමිත තරග විභාගය - 2012/2013**

## Department of Immigration and Emigration, Limited/Open Competitive Examination for the Recruitment to the Posts of Authorized Officers - 2012/2013

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. තරග විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදුකරන අතර, පුරප්පාඩුවලින් සියයට හැටක් (60%) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ද, ඉතිරි සියයට හතළිහ (40%) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයවලුන් සඳහා සීමිත තරග විභාග ප්‍රතිඵල මත ද පුරවනු ලැබේ. අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 10%ක් පමණක් කාන්තා නිලධාරිනියන් සඳහා වෙන් වේ.

2. ඉල්ලුම්පත් භාර ගැනීම, මෙම ගැසට් නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව 'ඒ4' ප්‍රමාණයේ (සෙ. මී. 21x29) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් ඉල්ලුම්පත් සකස්කර ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 5.0 තෙක් පළමුවන පිටුවට ද 6.0 සිට 12.0 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බව සැලකිය යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේදී ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍යය වේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත 2012.10.31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(අ) විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් එවීමේදී "ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා විවෘත තරග විභාගය 2012/2013 යනුවෙන් ද, සීමිත තරග විභාගය සඳහා අයදුම්පත් එවීමේ දී "ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා සීමිත තරග විභාගය 2012/2013" යනුවෙන් ද සීමිත හා විවෘත විභාග දෙකටම ඉල්ලුම් කරන්නේ නම් එක් ඉල්ලුම්පත්‍රයක් මගින් පමණක් ඉල්ලුම් කළ යුතු අතර "ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා සීමිත හා විවෘත තරග විභාගය 2012/2013" යනුවෙන් ද අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ සඳහන් කළ යුතුය.

(ආ) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නියමිත දිනට පෙර එවිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. ඉල්ලුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. *අනන්‍යතාවය.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

4. *සාවද්‍ය තොරතුරු.*—කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරනු ලැබ ඇති බව හෙළිවුවහොත් හෝ එසේ නැතහොත් යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කරනු ලැබ ඇති බව හෝ හෙළිදරව් වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

5. *වැටුප් පරිමාණය.*—මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා. ප. ච. 6 2006 (iv) හි MN 5 2006 A රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 -30685 වන අතර වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛනයේ සඳහන් විධිවිධාන අනුවය. තනතුරට පත්වීමෙන් පසු හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

6. *විභාග ගාස්තු.*—සීමිත හා විවෘත විභාග දෙකටම ඉල්ලුම් කරන්නේ නම් විභාග ගාස්තුව රු. 1,000 ක් වන අතර සීමිත හෝ විවෘත හෝ එක් විභාගයකට පමණක් ඉල්ලුම් කරන්නේ නම් විභාග ගාස්තුව රු. 800 ක් වේ. මෙම ගාස්තුව ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන සේ ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත්‍රයේ නිසි කොටුවේ අලවා (ලදුපතේ අංකය දිනය හා නිකුත් කළ කාර්යාලය සඳහන් කර) තිබිය යුතුය. කිසිදු හේතුවක් නිසා ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

7. *වයස් සීමාව.*—විවෘත බඳවා ගැනීම සඳහා අයදුම් කළ හැක්කේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි අයවලුන්ට පමණි. සීමිත විභාගය සඳහා ඉහත කී උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*සටහන.*-අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ ශාරීරික යෝග්‍යතාවය පහත පරිදි විය යුතුය. අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 05කුත් අඟල් 04ක් (සෙ. මී. 162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32ක් (සෙ. මී. 81.25) විය යුතුය. අයදුම්කාරියන්ගේ උස අඩි 05 අඟල් 02 (සෙ. මී. 156) ක් විය යුතුය.

8. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නව ප්‍රවේශයකු ලෙස මෙම තනතුරට බඳවා ගනු ලබන නිලධාරියෙකු රජය විසින් වරින් වර නියම කරනු ලබන ප්‍රතිශතයන් අනුව වැන්දඹු, අනත්දරු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත් කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. 2009.02.20 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 1589/30 දරන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ වගන්ති අදාළ වේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය එක් අවුරුදු පරීක්ෂණ කාලසීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

(iii) රා. ප. ච. 7/2007 හා 7/2007 (i) අනුව පත්වීමේ දින සිට වසර 05ක් තුළ දෙවන රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව ලබා ගත යුතුවේ. එසේ ප්‍රවීණතාව ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ.

(iv) තෝරාගනු ලබන නිලධාරීන් අනිවාර්යයෙන්ම දිවයින පුරා පිහිටි ගුවන් තොටුපලවල සහ වරායවල රාත්‍රී රාජකාරි කිරීමට ද යටත් වේ.

9. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(අ) **විවෘත** :- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ ජා. පො. අ. ස. විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට "බී" සාමාර්ථයක් සහිතව සමත් ශ්‍රී ලාංකික ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට මෙම තනතුර සඳහා අයදුම් කළ හැකිය.

(ආ) **සීමිත** : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව, M. N. - 01 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක වැටුපක් ලබන තනතුරක වසර 10කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයින්ට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

(i) මේ සඳහා දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම.;

සහ

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත් වී තිබීම අවශ්‍ය වේ.

10. ඉල්ලුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලි මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර තබා ගත යුතුය :

(i) උප්පැන්න සහතිකය,
(ii) ලබාගෙන තිබෙන උසස්ම අධ්‍යාපන සහතිකය,
(iii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්.

11. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුව සැලකීමෙන් සකස්කළ ප්‍රමුඛතා ලේඛනයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව බඳවා ගැනීම සිදු කෙරේ. (සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.)

(i) මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම කොළඹ දී පමණක් පවත්වනු ලබන අතර, විභාගය පවත්වන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රකාශයට පත් කරනවා

ඇත. ඉල්ලුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) අයදුම්කරුවන් සඳහා ප්‍රවේශපත් ඔවුන් තම අයැදුම්පත්‍රයේ සඳහන් කළ ලිපිනයට තැපැල් කර එවනු ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වෙනු ඇත.

(iv) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. තෝරා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගය

(අ) විවෘත තරග විභාගය :

(i) බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම කාලය පැය 01 යි ලකුණු 100 යි.

අපේක්ෂකයින්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතා, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම, මෑත භාගයේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා දේශපාලන තොරතුරු ද, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනීම සහ නව විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳව අරමුණු කරන ලද කෙටි හා, හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් වූ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

(ii) ඉංග්‍රීසි භාෂාව - කාලය පැය 02 යි. ලකුණු 100 යි. කියවීමෙන් අවබෝධය, ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

(iii) පරිගණක පිළිබඳ මූලික දැනුම - කාලය පැය 01 යි. ලකුණු 100 යි.

පරිගණක පිළිබඳ මූලික දැනුම - Ms Word, Ms Excel වැනි මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

(ආ) සීමිත තරග විභාගය :

(i) *අවබෝධය හා සාමාන්‍ය දැනීම.*—කාලය පැය 02 යි ලකුණු 100 යි.

අර්ථ විග්‍රහය, සාරාංශය හා ඡේදයක් වටහා ගැනීමේ හැකියාව, තීරණය කිරීම, මෑත භාගයේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා දේශපාලන තොරතුරු ද ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනීම සහ නව විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳව අරමුණු කරන ප්‍රශ්න ඇතුළත් වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) *ඉංග්‍රීසි භාෂාව.*—කාලය පැය 02 යි. ලකුණු 100 යි. කියවීමෙන් අවබෝධය. ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(iii) *පරිගණක පිළිබඳ මූලික දැනීම.*— කාලය පැය 01යි ලකුණු 100 යි.

*පරිගණක පිළිබඳ මූලික දැනීම.*—Ms Word, Ms Excel, වැනි මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

14. බලයලත් නිලධාරි තනතුරුවල පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාවත්, එම ඇබෑර්තු පුරවනු ලබන දිනයත් ආගමන හා විගමන පාලක ජනරාල් විසින් තීරණය කරනු ලබන අතර විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂකයින් එක් අයෙකුට හෝ වැඩි ගණනකට පත්වීම් නොදීමේ අයිතිය ආගමන හා විගමන පාලක ජනරාල් සතු ය.

15. මෙම *ගැසට්* පත්‍රයේ 1 වැනි කොටස (iiඅ) වැනි ඡේදයේ ඇති රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාළවන පොදු කොන්දේසි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් මෙම විභාගය සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් ද පොදුවේ බලපාන බව සලකන්න.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1733/52 හා 2011.11.25 දිනැති ගැසට් නිවේදනයෙන් පැවරී ඇති බලතල පරිදි,

ඩබ්. ඒ. සී. පෙරේරා,
ආගමන හා විගමන පාලක ජනරාල්.

2012 සැප්තැම්බර් මස 21 වැනි දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
අංක 41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත/සීමිත තරග විභාගය - 2012/2013

Department of Immigration and Emigration, Limited/Open Competitive Examination for the Recruitment to the Posts of Authorized Officers - 2012/2013

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*විභාගයට පෙනීසිටින භාෂා මාධ්‍යය :*

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| ඔබ ඉල්ලුම්කරන විභාගය | |
|---|---|

සීමිත විභාගය - 1/විවෘත විභාගය - 2
විවෘත, සීමිත දෙකටම - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :—————.

2.0 2.1 ස්ථිර ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් - මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)
2.2 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 රාජකාරි ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය (තිබේ නම්) :—————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජන වර්ගය
සිංහල - 1/ශ්‍රී ලංකා දෙමළ 2/ඉන්දියානු දෙමළ 3/
මුස්ලිම් 4/ බර්ගර් 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 විවාහක/අවිවාහක බව විවාහක 2/අවිවාහක 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.0 උපන් දිනය :

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

2012.10.31 දිනට වයස (අවු.) :

| අවුරුදු | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

7.0 මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය සමත් වූ භාෂා මාධ්‍යය :—————.

8.0 අධ්‍යාපන සුදුසුකම් :
(i) උපාධිය :—————.

(ii) අ. පො. ස. (සා.පෙළ) විභාගය :—————.

| | වර්ෂය | විෂයයන් ශ්‍රේණි සමග | |
|---|---|---|---|
| 1. | 1. | | 5. |
| | 2. | | 6. |
| | 3. | | 7. |
| | 4. | | 8. |

9.0 ශාරීරික යෝග්‍යතාව :
(i) උස : සෙ. මී. :—————.

(ii) පපුවේ වට ප්‍රමාණය සෙ. මී. :—————.

10.0 දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර :—————.
(ආ) දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය :—————.
(ඇ) මුල් පත්වීමේ දිනය :—————.
(ඈ) තනතුරේ ස්ථිර කළ දිනය :—————.
(ඉ) වැටුප් ක්‍රමය :—————.
(ඊ) දැනට ලබන වාර්ෂික වැටුප :—————.

11.0 කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණය මගින් ඔබ වරදකරු කර ඇත්තේ ද ?
එසේ නම් විස්තර දක්වන්න :—————.

12.0 ඔබ රජයේ තනතුරු දරමින් සිටිය දී එයින් පහ කර තිබේ ද ?

13.0 විභාග ගාස්තු ගෙවීම

(විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙහි අලවන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

සැලකිය යුතුයි.-ගැසට් නිවේදනයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු ගෙවූ බවට ලබාගත් ලදුපත ඉහත කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුයි.

ලදුපත් අංකය :—————.
ගෙවන ලද කාර්යාලය :—————.
දිනය :—————.
මුදල රු. :—————.

14.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක............... හා ............... දින දරන ලදුපත මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ ඉන් පසුව හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

15.0 (අ) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මහතා/මහත්මිය/මෙනවිය පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.

සහතික කරන අයගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
(සීමිත තරග විභාගයට පෙනීසිටින අයදුම්කරුවන් සඳහා පමණි)

........................මහතා/මහත්මිය/මෙනවිය ............... සේවයේ නියුතු .................. තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් .................. සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවට වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව

දිනය :————.

09-1264

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදී)
**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

**ග්‍රැෆික්ස් මල්ටිමීඩියා හා මුද්‍රණ ශිල්ප පාඨමාලා**
**COURSES IN GRAPHICS MULTIMEDIA AND PRINTING TECHNOLOGIES**

**ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි**
**වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පහත සඳහන් පාඨමාලා ළඟදීම ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.**

**ඕෆ්සෙට් ලිතෝකරණය**
**OFFSET LITHOGRAPHY**
මෙම පාඨමාලාව තුලින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳව පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම කෂේත්‍රයට ඇතුල් වීමට අභදස් කරන නවකයන්ටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වනු ඇත.

**පාඨමාලා කාලය : වසර 1යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තු: 13,750/-**

**පරිගණක ග්‍රැෆික්ස් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
**DIPLOMA IN COMPUTER GRAPHIC DESIGN**
මෙම පාඨමාලාව තුලින් පරිගණක ග්‍රැෆික්ස් තාක්ෂණය සහ නිර්මාණකරණය පිළිබඳව ගැඹුරු අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ප්‍රායෝගික හා න්‍යායාත්මක පංති අනුසාරයෙන් සකස් කර ඇති මෙම ඩිප්ලෝමා පාඨමාලාව තුලින් ඉතා උසස් මට්ටමේ වෙබ් අඩවි සහ ග්‍රැෆික් නිර්මාණ සකසන අයුරු මැනවින් පැහැදිලි කෙරේ.

දැනට ග්‍රැෆික්ස් නිර්මාණකරණයේ යෙදී සිටින පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයන්ටද මෙම පාඨමාලාව තුලින් පරිගණක ග්‍රැෆික්ස් නර්මාණකරණය පිළිබඳ පුළුල් පරාසයක දැනුමක් සහ පුළුල් ප්‍රායෝගික අවබෝධයක් ලබා ගත හැක.

**පාඨමාලා කාලය - වසර 1යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු - රු. 27,750/-**

**ද්විමාණ සහ ත්‍රිමාණ සජීවිකරණය පිළිබඳ පාඨමාලාව**
**2D AND 3D DIGITAL ANIMATION**
ප්‍රචලිතව පවතින සජීවිකරණ මෘදුකාංග ඇසුරෙන් ද්විමාන සහ ත්‍රිමාන චලන රූප නිර්මාණය කර ඒවා චිත්‍රපට, රූපවාහිනී සහ වෙනත් වීඩියෝ කාර්යයන්ට භාවිතා කරන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ. මේ සඳහා උනන්දුවක් දක්වන නවකයන්ට මෙන්ම එම අදල ක්ෂේත්‍රවල නියැළි පුද්ගලයන්ටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 06යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 19,250/-**

**වෙබ් අඩවි නිර්මාණය**
**WEB DESIGNING**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබාදෙන අතර නවීන තාක්ෂණයට අනුකූලව පාඨමාලා අන්තර්ගතය සකස් කර ඇත. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම පරිගණක ආශ්‍රිත පාඨමාලා හදාරණ සිසුන්ටද මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 04 (අර්ධකාලීන)මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 14,250/**

**මායා**
**MAYA**

චිත්‍රපට, පරිගණක ක්‍රීඩා, බහු මාධ්‍ය වීඩියෝ නිෂ්පාදන සඳහා භාවිතා කරන මායා නම් ප්‍රචලිත මෘදුකාංග භාවිතය පිළිබඳ පුළුල් මට්ටමේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් මෙම පාඨමාලාව තුළින් ලබා දේ. මෙම පාඨමාලාව හැදෑරීමෙන් සරල මෙන්ම වෘත්තීය මට්ටමේ සජීවිකරණ නිර්මාණ Animation Production කිරීමට පුළුල් හැකියාවක් ලැබෙනු ඇත.

**පාඨමාලා කාලය - මාස 06යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 22,500/**

**මුද්‍රණ නිෂ්පාදන කළමණාකරණ පාඨමාලාව**
**PRINT PRODUCTION MANAGEMENT**

මුද්‍රණ ක්ෂේත්‍රයේ මෙන්ම ඒ හා ආශ්‍රිත කර්මාන්තයන්හි නියුතු පුද්ගලයන්ට මුද්‍රණ නිෂ්පාදන කළමණාකරණ ක්ෂේත්‍රයට අදාල වැදගත් කරුණු එක් කොට සකස් කෙරුණු පාඨමාලාවකි මුද්‍රණ නිෂ්පාදන කලමණාකරණ පාඨමාලාව. මෙම පාඨමාලාව මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි අධීක්ෂණ නිලධාරීන්ට, කළමණාකරුවන්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් දක්වන අනෙකුත් ක්ෂේත්‍ර වල නිළධාරීන්ට ද සුදුසු අන්තර්ගතයකින් සකස් කොට ඇත.

**පාඨමාලා කාලය - මාස 06යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 13,750/**

**අරේඛීය සංස්කරණය පිළිබඳ පාඨමාලාව**
**NON LINEAR EDITING**

මෙම පාඨමාලාව තුළින් වීඩියෝ, රූපවාහිනී සහ චලන චිත්‍රපට සංස්කරණය කරන අයුරු විස්තරාත්මකව පැහැදිලි කෙරේ. වීඩියෝ, රූපවාහිනී සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වනු ඇත.

**පාඨමාලා කාලය - මාස 04යි මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු රු. - 19,250**

**මාතලේ ශාඛාව, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**දිසා ලේකම් කාර්යාලය - මාතලේ**
**දුරකථන අංක : 0662222172, 0714895044**

**විමසීම් - ප්‍රධාන කාර්යාලය**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**
ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162 ඊමේල් : sliopreg@sltnet.lk
web: www.sliop.com

09-1262

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.